# 11. උගන්නෑ සියබස

## මත් වැන්නෑ එහි රසයෙන්

**ශ්‍රේණිය** : 9

**වාරය** : II

**නිපුණතා මට්ටම්** : 10.1 **සාහිත්‍යයික හා දාර්ශනික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන ඇසුරු කරයි.**

6.4 **සම්මත රීතිවලට අනුගත ව වාක්‍ය ලියයි.**

**<u>ක්‍රියාකාරකම්</u>**

- **පාඩම හොඳින් කියවන්න. අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. **කෙටි පිළිතුරු ලියන්න.**

i. දෙස, බස, රැස යන්න හඳුන්වන්න.

දෙස -

.......................................................................................................................

බස -

.......................................................................................................................

රැස -

.......................................................................................................................

ii. කුමාරතුංග මුනිදාසයන් සිංහල භාෂාවේ උන්නතියට කළ සේවාවන් හතරක් ලියන්න.

(අ) .......................................................................................................................

(ආ) .......................................................................................................................

(ඇ) .......................................................................................................................

(ඈ) .......................................................................................................................

iii. කුමරතුඟුවන් රචනා කළ ළමා සාහිත්‍ය කෘති පහක් නම් කරන්න.

(අ) .......................................................................................................................

(ආ) .......................................................................................................................

(ඇ) .......................................................................................................................

(ඈ) .......................................................................................................................

(ඉ) .......................................................................................................................

iv. එතුමා විවරණ සැපයූ ග්‍රන්ථ ගණන කීයද? ඉන් පහක් ලියන්න.

(අ) .......................................................................................................................

(ආ) .......................................................................................................................

(ඇ) .......................................................................................................................

(ඈ) .......................................................................................................................

(ඉ) .......................................................................................................................

v. එතුමාගේ නායකත්වයෙන් බිහි වූ භාෂා සංවිධානයේ නම කුමක් ද?

..............................................................................................................................................

vi. එහි කාර්යභාරය කෙබඳු වීද?

..............................................................................................................................................

..............................................................................................................................................

vii. කාව්‍ය රස හා අලංකාර පහදා දීමට එතුමා ලියූ කෘති දෙක ලියන්න.

............................................................ ...............................................................

viii. කුමාරතුංගයන් සිංහල ව්‍යාකරණය සම්බන්ධයෙන් ලියූ පොත් දෙක නම් කරන්න.

............................................................ ...............................................................

**2. පාඩමේ ඇතුළත් පහත දැක්වෙන වචනවල අර්ථය ලියන්න.**

i. ප්‍රකට - .......................................
ii. පිළිකෙව් - .......................................
iii. හසළ - .......................................
iv. උන්නතිය - .......................................
v. අනුභූතිය - .......................................
vi. කයෝ්ර - .......................................
vii. ස්වීයත්වය - .......................................
viii. අභිමානය - .......................................
ix. අනතිමානි - .......................................
x. ප්‍රගමනය - .......................................

**3. පාඩමේ ඇතුළත් පහත දැක්වෙන සම්භාව්‍ය කෘති ලියැවුණු සාහිත්‍ය අවධීන් ලියන්න.**

i. එළු අත්තනගලු වංශය - .......................................
ii. සුභාෂිතය - .......................................
iii. පූජාවලිය - .......................................
iv. අමාවතුර - .......................................
v. සද්ධර්මරත්නාවලිය - .......................................
vi. සසදාවත - .......................................
vii. මුවදෙව්දාවත - .......................................
viii. කව් සිළුමිණ - .......................................

**4. පහත (අ) කොටසින් දැක්වෙන වචන සඳහා කුමරතුඟුවන් සැකසූ හෙළ වදන් (ආ) කොටසින් තෝරා යා කරන්න.**

| (අ) | | (ආ) |
|---|---|---|
| i. | සබ්මැරීනය | රෙදෙළුව |
| ii. | රේඩියෝව | හසුන් යහළු |
| iii. | බයිසිකලය | කුමුදුව |
| iv. | පෑනේ මිතුරා | දුරදක්නය |
| v. | විශ්ව විද්‍යාලය | හෙදිය |
| vi. | මෝටර් සයිකලය | පාපැදිය |
| vii. | ටෙලස්කෝපය | සරසවිය |
| viii. | සාත්තු සේවිකාව | යතුරු පැදිය |

**5. සිංහල පුවත්පත් කලාවට කුමරතුඟුවන්ගෙන් සිදු වූ සේවාව කෙබඳු වී ද?**

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

**6. සිංහල භාෂා දිනය ලෙස නම් කළ දිනය කවදා ද?**

**එය කිනම් කරුණක් මත පදනම් වී කරන ලද නම් කිරීමක් ද?**

..............................................................................................................................................

..............................................................................................................................................

**7. 'කුමාරතුංග මුනිදාසයන් සිංහල භාෂාවට හා සාහිත්‍යයට මහඟු මෙහෙවරක් ඉටු කළ විද්වතෙකි' මේ පිළිබඳව ඔබේ අදහස් ලියන්න.**

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

# <u>වාක්‍ය රීති</u>

## <u>නිත්‍ය බහු වචන පද</u>

1. නිත්‍ය බහුවචන පදවල උක්ත අනුක්ත භේදය සලකමින් පහත වගුව පුරවන්න.

| | උක්තය | අනුක්තය |
|---|---|---|
| i | අයෙක් | ................................ |
| ii | ................................ | කෙනෙකු |
| iii | ඇතමෙක් | ................................ |
| iv | කිසිවෙක් | ................................ |
| v | ................................ | යමෙකු |
| vi | ................................ | තවකෙකු |
| vii | සමහරෙක් | ................................ |
| viii | ................................ | දෙනෙකු |

**2. සුදුසු නිත්‍ය බහු වචන පද යොදා පහත වාක්‍යවල හිස්තැන් පුරවන්න.**

i. ........................................ ජීවිතය සාර්ථක කර ගැනීමට වෙහෙසෙති.

ii. ප්‍රමාද වී පැමිණි ........................................ දොරටුව අසල සිටිති.

iii. ......................................... සාහිත්‍ය තරගවලට සහභාගී වූහ.

iv. ......................................... විදේශ රැකියාවල නියුතු වෙති.

v. ශ්‍රාවකයින්ගෙන් ................................ නො නිදා රැය පහන් කළහ.

**3. සමහර නිත්‍ය බහු වචන පද ඒකාර්ථයේ හෙවත් එ්ක වචන අර්ථයේ යෙදේ. එහි දී ක්‍රියා පදය ද ඒක වචනයෙන් තැබේ. පහත වාක්‍යවල හිස්තැන් පුරවන්න.**

i. ........................................ වෙළඳ පොළට ගියා ය.

ii. ........................................ කාර්යාලයේ අතිකාල වැඩෙහි යෙදුණේය.

iii. ......................................... මහමග සිඟමනේ යෙදෙයි.

iv. මා යන විට ක්‍රීඩාගාරයේ ..................................... නොසිටියේ ය.

v. වාහනය ඇතුළේ එක් ................................ සිර වී සිටියේ ය.

## ආඛ්‍යාතය බහු වචනයෙන් යෙදෙන අවස්ථා

4. පහත දැක්වෙන වාක්‍ය නිවැරදි කර නැවත ලියන්න.

i. තෙරණියෝ ආරාමයට වැඩම කළා ය.

..........................................................................................................................................

ii. පියාණන් දැ සම්පත් දරුවන්ට පැවරුවේ ය.

..........................................................................................................................................

iii. නාහිමියෝ දහම් දෙසයි.

..........................................................................................................................................

iv. ගුරුළු ගෝමීන් අමාවතුර ලිව්වේ ය.

..........................................................................................................................................

v. බෑනණුවන් සැමට උපකාර කළහ.

..........................................................................................................................................

vi. අඳුර වැටෙද්දී ගව රැළ ගාල කරා ඇදෙයි.

..........................................................................................................................................

vii. මල් පොකුර දසත සුවඳ විහිදුවති.

..........................................................................................................................................

viii. සාමාජික පිරිස තරගයෙන් ඉවත් විය.

..........................................................................................................................................

ix. සියොත් කැල ගුවන සිසාරා පියෑඹුවේ ය.

..........................................................................................................................................

x. ගැහැනු කෙනෙක් මහ මග නැවතී බලා සිටියහ.

..........................................................................................................................................

# පිළිතුරු

## උගන්නෑ සියබස

1. i. දේශය, භාෂාව, ජාතිය

   ii. * සිංහල ව්‍යාකරණය සම්බන්ධ පොත් ලිවීම

   * පැරණි පොත් 26 ක් සංස්කරණය කිරීම

   * කාව්‍ය රස හා අලංකාර පහදා දීමට පොත් ලිවීම

   * ළමා පරපුරේ සාහිත්‍ය රසඥතාව වර්ධනයට මග පෙන්වීම

   * පුවත්පත් කලාව නව මගකට යොමු කිරීම

   * හෙළ පවුල පිහිටුවා ජාතියට, ආගමට, භාෂාවට අභිමානයක් ලබා දීම

   * සිංහල භාෂාවේ පාරිභාෂික වචන නිර්මාණය කිරීම

   * සුබය වැනි සඟරා එළි දැක්වීම

   iii. හීන්සැරය, හත්පණ, මඟුල් කෑම, කුමර ගී, ශික්ෂා මාර්ගය, කියවන නුවණ

   iv. 26 කි. නිකාය සංග්‍රහය, සුභාෂිතය, පූජාවලිය, අමාවතුර, සසදාවත, මුවදෙව්දාවත, කව් සිළුමිණ

   v. හෙළ හවුල

   vi. හෙළ බසට, ජාතියට, ආගමට අභිමානයක් ලබා දීමට උත්සාහ දැරීම

   vii. විරිත් වැකිය, කවි ශික්ෂාව

   viii. ක්‍රියා විවරණය හා ව්‍යාකරණ විවරණය

2. i. ප්‍රසිද්ධ ii. ප්‍රතික්ෂේප iii. ප්‍රවීණ iv. දියුණුව

   v. අත්දැකීම vi. රළු / කටුක vii. තමන්ගේ බව viii. ආඩම්බරය

   ix. නිරහංකාර x. දියුණුව

3. i. ගම්පොළ යුගය ii. සීතාවක යුගය iii. දඹදෙණි යුගය

   iv. පොළොන්නරු යුගය v. දඹදෙණි යුගය vi. පොළොන්නරු යුගය

   vii. පොළොන්නරු යුගය viii. දඹදෙණි යුගය

4. i. කුමුදුව ii. රෙදෙළුව iii. පාපැදිය iv. හසුන් යහළු

   v. සරසවිය vi. යතුරු පැදිය vii. දුරදක්නය viii. හෙදිය

5. i. ලක්මිණ පහන මගින් වර්තමාන පුවත්පත් කලාවට බලපෑම් සිදු කිරීම

   ii. සුගම ජීවමාන ශෛලියකින් යුතු සිරස්තල භාවිතය

   iii. සිරස්තල වර්තමාන කාල ආඛ්‍යාතයෙන් තැබීම ආරම්භ කිරීම

6. මාර්තු 02 - සිංහල භාෂාවේ ප්‍රගමනයට කුමාරතුංග දායකත්වය අනුස්මරණය කිරීමේ පරමාර්ථයෙන්

7. i. සිය වෘත්තීය ජීවිතයෙන් බැහැර ව භාෂා සාහිත්‍ය සේවාවට කැපවීම

   ii. හෙළ හවුල නම් සංවිධානයක් පිහිටුවා ගැනීම

   iii. සිය ජීවිතය හැඩගැස්වීමට පියාගේ දායකත්වය හෙළි කිරීම

iv. තම මතය පවා කරුණු ඇතොත් වෙනස් කර ගැනීම

v. වරද පෙන්වා දුන් කෙනෙකුට ස්තුති කොට වරද පිළිගැනීම

vi. විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පොත්පත් ලියා සිංහල භාෂාවට සාහිත්‍යයට නව මං විවර කිරීම

vii. ළමා සාහිත්‍ය පෝෂණයට සුවිශේෂ ක්‍රියා ආරම්භ කිරීම

viii. 'ඇ' කාරය වත්මන් පරපුරට හඳුන්වා දී පැරණි භාෂා සම්ප්‍රදායට පණ පෙවීම

ix. යමක් තර්කානුකූලව විමසා තහවුරු කර ගැනීම

x. පරබස් යෙදුම්වලට යෝග්‍ය සිංහල වචන නිපදවා සිංහල වාක්කෝෂය පුළුල් කිරීම

xi. දෙස බස රැස සංකල්පය ඔස්සේ ජාතියට, ආගමට, භාෂාවට අභිමානයක් නව ජීවයක් ලබා දීම ... ආදී

## <u>වාක්‍ය රීති</u>

1.

| | <u>උක්තය</u> | <u>අනුක්තය</u> |
|---|---|---|
| i. | - | අයෙකු |
| ii. | කෙනෙක් | |
| iii. | - | ඇතමෙකු |
| iv. | - | කිසිවෙකු |
| v. | යමෙක් | |
| vi. | තවකෙක් | |
| vii. | - | සමහරෙකු |
| viii. | දෙනෙක් | |

**2.** සුදුසු උක්ත - නිත්‍ය බහුවචන පද

සමහරෙක්, ඇතමෙක්, කිසිවෙක්, කෙනෙක්, තවකෙක් ....... ආදි

**3.** i. නෝනා කෙනෙක් / ගැහැනු කෙනෙක් ii. එක් කෙනෙක් / අයෙක්

iii. සිඟන කෙනෙක් / අයෙක් iv. කිසිවෙක් v. අයෙක් / කෙනෙක්

**4.** i. තෙරණියෝ ආරාමයට වැඩම <u>කළහ / කළෝ ය</u>.

ii. පියාණන් ද සම්පත් දරුවන්ට <u>පැවරුවෝ ය / පැවරූහ</u>.

iii. නාහිමියෝ දහම් <u>දෙසති.</u>

iv. <u>ගුරුළු ගෝමී</u> අමාවතුර ලිව්වේ ය.

v. <u>බෑණනුවෝ</u> සැමට උපකාර කළහ.

vi. අඳුර වැටෙද්දී ගව රැළ ගාල කරා <u>ඇදෙති</u>.

vii. මල් පොකුර දසත සුවඳ <u>විහිදුවයි</u>.

viii. සාමාජික පිරිස තරඟයෙන් <u>ඉවත් වූහ</u>.

ix. සියොත් කැල ගුවන සිසාරා <u>පියෑඹුවෝ ය / පියෑඹූහ</u>.

x. ගැහැනු කෙනෙක් මහ මග නැවතී බලා <u>සිටියා ය</u>.